උ.ප.රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක : 24/2019

මගේ අංකය **NP/07/10/01/131**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
01.08.2019

අමාත්‍යාංශ ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලනය,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - ඉංජිනේරු සේවය,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

උතුරු පළාත.

## උතුරු පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරීන් (සිවිල්) III වන ශ්‍රේණියේ හා පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා සීමිත බඳවා ගැනීමේ තරග විභාගය - 2018

උතුරු පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරීන් (සිවිල්) තනතුරේ දක්නට ලැබෙන තනතුරු පුරප්පාඩු **දහතුනක් (13)** සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගයක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් **2019 සැප්තැම්බර් මාසය වන විට** යාපනයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනුයේ **30.08.2019** දිනයි.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 2013.06.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් තාක්ෂණ සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් නියෝග, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් ප්‍රඥප්තීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන ආයතන සංග්‍රහය හා මතු පැමිණෙන කාලවලදී ඇති කරන සංශෝධනයන්ට ද යටත්ව තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ III වන ශ්‍රේණියට හා පුහුණු ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 මෙම තරග විභාගයෙන් සමත්වන විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසරක් වැඩ බලන පරිවාස කාලයට යටතේ කර එම පදනම මත තාක්ෂණ නිලධාරි III වන ශ්‍රේණියට පත් කරනු ලබයි. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ III වන ශ්‍රේණියට හා පුහුණු ශ්‍රේණියට බඳවාගත් දින සිට වසර 03 ක කාලය තුළ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුයි.

02.3 ඉහත තරග විභාගය මගින් පුහුණු ශ්‍රේණියට අදාල පත්වීම් සඳහා තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් තාක්ෂණ නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණියට පත් කරනු ලැබේ. මෙම පුහුණු ශ්‍රේණියට අදාළව නියම කර වෙන් කරන පුහුණු කාලසීමාව අවසානයෙන් පසු සුදුසුකම් පරීක්ෂා කිරීම් විභාගයකට පෙනී සිටිය යුතුයි. මෙම විභාගයෙන් සමත් වුවොත් පමණක් අපේක්ෂකයන්ට III වන ශ්‍රේණියේ තනතුර සඳහා පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

02.4 මෙම සේවාවන් ස්ථාන මාරුවීම් වලට යටත් වූ සේවාවන් වේ. එබැවින් මෙම පත්වීම් ලබන්නන් උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන නියෝගයට යටත් විය යුතුයි.

02.5 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අපේක්ෂකයෙක්, එම සේවා ස්ථානයේ අවම වශයෙන් අවුරුදු පහක් (05) අඛණ්ඩව සේවය කළ යුතුයි. මෙය අත්‍යාවශ්‍ය නියෝගයකි.

02.6 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා රට අදාල සියළුම චක්‍රලේඛවලට අනුව පත්වීම් දින සිට වසර පහක් (05) අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතුයි.

02.7 පත්වීම් සංඛ්‍යාව හා මේ පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදී කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට යෝජිත අපේක්ෂකයන් ගේ සංඛ්‍යාව දහතුනක් (13) වන අතර දන්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාවලින් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය :-

**03.1 පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණික නිලධාරීන් (සිවිල්) III වන ශ්‍රේණියේ තනතුර සඳහා:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, වැටුප් කාණ්ඩය **MN 3 - 2016** ට අනුව **I වැනි වගුවේ** සඳහන් තනතුරුවල III වන ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ **රුපියල් 31,040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57,550/-** කි. (රුපියල් 32,375/- යන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම 1 වන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුයි) එසේ වූව ද ඉහත චක්‍රලේඛයේ **II වැනි වගුවේ** සඳහන් විධිවිධායන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03.2 පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණික නිලධාරීන් (සිවිල්) පුහුණු ශ්‍රේණියේ තනතුර සඳහා:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, එම චක්‍රලේඛයේ **V – වන වගුවේ** සඳහන් විධිවිධානයන් ප්‍රකාර මාසික දීමනාව රුපියල් 24,336.00 ක් හා ගැලපුම් දීමනා ද ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය මනා ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයන් විය යුතු අතර මනා චරිතවත් පුද්ගලයකු ද විය යුතුයි.

04.3 අයදුම්පත භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම අයදුම්කරු විසින් **සියළුම සුදුසුකම්** සම්පූර්ණ කර තිබිය යුතුයි.

04.4 සීමිත තරග විභාගය මගින් බඳවා ගන්නා විට **ඉහළම වයස් සීමාව** බලපාන්නේ නැත.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-

**05.1 තාක්ෂණ නිලධාරි (සිවිල්) පුහුණු ශ්‍රේණිය (පුහුණු කාලය වසර 01 කි)**

**(අ). අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාරවලදී** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන්ට සම්මාන සාමාර්ථය සමඟ විෂයයන් **හයක් (06)** සමත්වී තිබීම.

**(ආ). වෘත්තීය සුදුසුකම්**

පහත සඳහන් වෘත්තීය සුදුසුකමක් සමඟ තාක්ෂණ සේවය හා සම්බන්ධ සිවිල් (ඉදිකිරීම්) වැඩ සඳහා වසර **පහකට (05) නොඅඩුව** සේවා අත්දැකීම් ලබා තිබිය යුතුයි.

1. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණ විද්‍යාලයක ජාතික තාක්ෂණ විද්‍යා සහතිකයක් (NCT) (සිවිල්) හිමිකර තිබිය යුතුයි.

හෝ

2. තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණ විද්‍යා වෘත්තීය ක්ෂේත්‍ර තාක්ෂණවේදී ක්ෂේත්‍රයක සුදුසු තනතරකට ජාතික සහතික (NCC) (සිවිල්) පාඨමාලාවක් තෘප්තිමත් ලෙස හදාරා සහතිකයක් හිමිකර තිබිය යුතුයි.

හෝ

3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ විද්‍යා සහතික ප්‍රදාන ආයතනවලින් අදහස් ලබාගත් පසු ඉහත සඳහන් තාක්ෂණවේදී සුදුසුකම්වලට සියළුම ආකාරයකින් සමාන යයි තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් සුදුසුකම්.

ඒ සමගම

**(ඇ) සේවා අත්දැකීම්**

තාක්ෂණ සේවාව හා සම්බන්ධ සිවිල් (ඉදිකිරීම්) කටයුතුවල මුල් මට්ටම හෝ ඊට වැඩිනතත් සේවා අංශයක ස්ථිර, දෙපාර්තමේන්තු තනතුරක වසර දහයක් (10) සක්‍රීය හා තෘප්තිමත් සේවා අත්දැකීමක් හිමිකර තිබිය යුතුයි.

## 5.2 තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගැනීම

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාරවලදී** භාෂාව (දෙමළ / සිංහල / ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයන්ට සම්මාන සාමාර්ථය සමඟ විෂයයන් **හයක් (06)** සමත්වී තිබීම.

**(ආ). වෘත්තීය සුදුසකම්**

පහත සඳහන් ආයතනයකින් තාක්ෂණ නිලධාරි (සිවිල් ) තනතුර හා සම්බන්ධ වෘත්තිය සුදුසුකමක් ලබා තිබීම.

1. මොරටුව විශ්වවිද්‍යායෙන් හෝ අම්පාර හාඩි තාක්ෂණ විද්‍යායතනයෙන් ප්‍රදානය කෙරෙන ජාතික තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා (සිවිල්) සහතිකය

**හෝ**

2. ජාතික පුහුණු හා වාත්තීය වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ප්‍රදානය කෙරෙන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය.

**හෝ**

3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රදානය කෙරෙන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (සිවිල්) සහතිකය

**හෝ**

4. අනුමත කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කෙරෙන තාක්ෂණ විද්‍යා ඩිප්ලෝමා (සිවිල්) සහතිකය

**හෝ**

5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් (IESL) පැවැත්වෙන ඉංජිනේරු විභාගයෙන් පළමු අදිරය තෘප්තිමත් ලෙස සම්පූර්ණ කර තිබිය යුතුයි

**හෝ**

6. තාක්ෂණ නිලධාරි (සිවිල්) ක්ෂේත්‍රය හා සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - VI (NVQ Level - VI)

**හෝ**

7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ විද්‍යා සහතික නිකුත් කරන ආයතනවලින් අදහස් ලබාගත් පසු ඉහත තාක්ෂණ විද්‍යා සුදුසුකම් වලට සියළුම ආකාරයේ සමාන බව තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් සුදුසුකම් .

**ඒ සමඟ**

**(ඇ). සේවා අත්දැකීම්**

තාක්ෂණ සේවාව සමඟ සම්බන්ධ සිවිල් (ඉදිකිරීම්) කටයුතු වල ආරම්භ මට්ටම හෝ ඊට ඉහළ මට්ටමේ සේවා අංශයක ස්ථිර, දෙපාර්තමේන්තු තනතුරක වසර **පහක (05)** සක්‍රීය හා තෘප්තිමත් සේවා අත්දැකීමක් තිබිය යුතුයි.

**සටහන :-**

යම්කිසි තනතුරකට ස්ථිර ලෙස පත් කිරීමට ප්‍රථම සේවය කර ඇති හෝ කිසියම් තනතුරකට ස්ථිර පත්වීම් ලබාදීමට ආදාල කොන්දේසි මත සේවය කර ඇති හෝ පුහුණුවක් ලැබීමේ කාලසීමාවක් ලෙස ඉහත ඡේද **05.1(ඇ)** හා **05.2(ඇ)** හා හි සඳහන් සුදුසුකම් ලැබීමට **වසර දහය හා වසර පහ** කාලසීමාව ලෙස ගණන් ගනු නොලැබේ. කිසියම් තනතුරක ස්ථිර පත්වීම් ලබාදීමට ප්‍රථම තාවකාලික / අනියම් පදනම මත සේවය කර ඇති කාලසීමාවන් හා ඉහත ඡේද **05.1(ඇ)** හා **05.2(ඇ)** හි සඳහන් කර ඇති සුදුසුකම් ලැබීමට **වසර දහයක හා වසර පහක** කාලසීමාව ගණන් ගන්නේ නැත.

**අවධානයට :**

**අයදුම්කරුවන් සියළු දෙනාම සුදුසුකම් සියල්ල 2019.08.30 වැනි දිනට හෝ ඊට ප්‍රථම සම්පූර්ණ කර තිබිය යුතුයි.**

## 06. බඳවා ගන්නා ක්‍රමය :-

06.1 ලිඛිත විභාගය හා කුසලතාවය පදනම් කරගෙන, බඳවා ගන්නා අවස්ථාවේදී බලාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ සැලැස්ම, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යන කරුණුවලට එකගව තාක්ෂණික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මඟින් කැඳවන ලද සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව දැනුවත් වුවහොත් මෙම තනතුර දැරීමට ඇති අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මෙහිදී ලකුණු ප්‍රදානය කිරීමක් සිදු නොවේ.

06.2 ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අයදුමකරුවන්ගෙන්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලබා ගන්නා සම්පූර්ණ ලකුණු පිළිවෙළ අනුව පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

06.3 තාක්ෂණික නිලධාරි (සිවිල්) යන තනතුරේ **III වන ශ්‍රේණියට** සෘජුවම බඳවා ගනු ලැබේ. බඳවා ගන්නා ශ්‍රේණිය වන **III වන ශ්‍රේණියට** සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී ඉතිරිවන පුරප්පාඩු පුහුණු ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගන්නා අයදුම්කරුවන් සමඟ පූර්ණය කරනු ලැබේ.

06.4 පුරප්පාඩුවලින් 03% විශේෂ අවශ්‍යතා ඇති (ආබාධිත) අය සඳහා වෙන් කරනු ලැබේ. විභාග අපේක්ෂකයා පත්වීම් සඳහා තෝරා ගන්නා විට අදාල තනතුරේ සේවය කිරීම සඳහා තම විශේෂ අවශ්‍යතාවයේ තත්වය (Disability) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මඟින් ඔප්පු කළ යුතුයි. එසේ වුවත් විශේෂ අවශ්‍යතාවයක් ඇති විභාග අපේක්ෂකයෙක් පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමේ පදනම මතයි.

## 07. විභාග ගාස්තු :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් 500.00 ක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ අංක **"3401"** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා යොමු කළ යුතුයි. මොනයම් හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙන විභාගයක් සඳහා මාරු කිරීමට ද අවස්ථාව දෙනු ලබන්නේ නැත..

## 08. අයදුම්කරන ක්‍රමය :-

08.1 මෙම දැන්වීම් අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (සෙ.මී 21 x සෙ.මී 29) කඩදාසියේ 1 සිට 4.7 දක්වා ඡේද පළමු පිටුවේ ද 4.8 සිට 7.0 දක්වා ඡේද දෙවන පිටුවේ ද ඉතිරි කොටස් තුන්වන පිටුවේ ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **30.08.2019** වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක :393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.

08.2 අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ **"උතුරු පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරේ III වන ශ්‍රේණියේ හා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය – 2019"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

08.3 අයදුම්පතේ ඡායා පිටපත තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත් යනාදී භාරගනු නොලැබේ. විභාගයට අදාල ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු **අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ සැළකිය නොයුතුයි.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් අවම වශයෙන් විභාගය පැවැත්වීමට නියමිත දිනයට දින තුනකට (03) පෙර හෝ ප්‍රවේශ පත්‍ර තමා වෙත නොලැබුණේ නම් එය සම්බන්ධයෙන් වහාම පහත සඳහන් විස්තර සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** : 393/48, **කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංකය - 021 221 9940)

**සටහන** :-

**ආවරණ ලිපිය, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.**

08.5 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසුකම් පූර්ණය කරනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සඳහා කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ.

## 09. විභාග අපේක්ෂකයගේ අනන්‍යතාවය :-

අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයන් සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරියා සෑහීමකට පත්වන ආකාරයට ඔබගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් ඕනෑම ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ බලපත්‍රය.

(iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයෙකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත් ලේකම්,** විසින් අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කිරීම යනු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන දඬුවම්වලට යටත් වීමට සිදුවන බව දන්වා සිටිනු ලැබේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයෙන් නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුයි. මෙම විභාග රේගුලාසින් ප්‍රකාර යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ අපේක්ෂකයාට සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කර ගැනීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මඟින් අයදුම් කරන අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙක් මඟින් සහතික කර ගත යුතුයි.

## 12. විභාග සැලැස්ම :-

මෙම ලිඛිත විභාගය පහත සඳහන් කර ඇති පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් දෙකකින්ම පැවැත්වීමට නියමිතය. අයදුම් කරන ලද භාෂාව මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙන්නේ නැති අතර මෙම ලිඛිත විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් කිසිවෙකුට නැවත නිවැරදි කිරීම් කටයුතු සඳහා විධිවිධාන යොදා නැත.

| අංක | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රවල අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ තර්කානුකූල හැකියාව, තීරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණ හැකියාව යනාදිය අගය කිරීම සඳහා සකස් කරන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02. | තාක්ෂණය හා සම්බන්ධ පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුගේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ මූලික දැනුම, ගොඩනැගිලි සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, ගොඩනැගීම් කටයුතුවලට අදාල කෙටුම්පත් (Plan) සකස් කිරීම හා කෙටුම්පත (Plan) තේරුම් ගැනීම, මිනුම්, පදනම, පසේ වර්ගය, වීදි නිර්මාණය හා නඩත්තු කිරීම ඇස්තමේන්තු සකස් කිරීම, ජල සැපයුම, කාණු සකස් කිරීම හා කසල ඉවත් කිරීම යන කරුණු අගය කිරීම සඳහා සකස් කරන ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 |

**සටහන්** :-

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට නම් සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන්කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක් **(40%)** ලබාගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල :-

විභාග අපේක්ෂකයන්ට අදාල විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයෙකුටම වෙන වෙනම තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුව ඇත. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

**අ.සිවපාලසුන්දරන්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත්.
**01.08.2018**

**පිටපත්** :-

01. ප්‍රධාන ලේකම්, උතුරු පළාත. - දැ.ගැ.ස
02. ආණ්ඩුකාරතුමාගේ ලේකම්, උතුරු පළාත. - දැ.ගැ.ස
03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, උතුරු පළාත.

- අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකර අප වෙත යොමු කිරීම සඳහා.